වත්තේගම නගර සභාව
මහනුවර දිස්ත්‍රික්කය
--------------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 30 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 ජූලි 07 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 තත්ත්වාගණනය කළ මතය
-----------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වත්තේගම නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සථාවර තැන්පතු 02 කට අදාළ පොළිය රු.23,357ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව සතු මහජන බැංකුවේ ඇති ස්ථාවර තැන්පතුවල පොළී ආදායම රු.64,331 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

1.3.2 අසම්භාව්‍ය බැරකම්
----------------------

බාහිර පාර්ශවයන් තිදෙනෙකු සභාවට එරෙහිව පැවරූ නඩු 3 ක් සම්බන්ධව ගිණුම් වලින් හෙළිදරව් කර නොතිබුණි.

1.3.3 නොසැසඳූ පාලන ගිණුම්
----------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වලට අනුව පොදු ගබඩා තොගයේ වටිනාකම රු.3,516,563 ක් වුවද, උපයෝගී ලේඛන අනුව රු.2,981,810 ක් වූයෙන් රු.534,753 ක් වෙනසක් විය.

1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) ලැබිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 02 ක එකතු වටිනාකම රු.9,352,793 ක් වූ අතර, එයින් වර්ෂ 1-5 දක්වා කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂ එකතුව රු.429,913 ක් හා වර්ෂ 5 කට වැඩි කාලයක් ඉක්මවූ ශේෂය රු.1,452,025 ක් විය.

(ආ) ගෙවිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පැවති ණය හිමි ශේෂ 2 ක එකතු වටිනාකම රු.11,082,806 ක් වූ අතර, එයින් වර්ෂයකට වැඩි කාලයක් ඉක්මවූ ශේෂය රු.354,772ක් විය.

1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු.6,624,210 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.6 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| **නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |
| (අ) 2016 මාර්තු 17 දිනැති හා අංක 2016/03 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | |
| (i) 10 ඡේදය | බදු ගිවිසුම්ගත කඩකාමර අතුරු බද්දට ලබාදීම සම්පූර්ණයෙන්ම තහනම් වුවත්, 2016 නොවැම්බර් 09 දින විගණන ක්ෂේත්‍ර පරීක්ෂාවේදී බදුකරුවන් විසින් අතුරු බදු ලබා දුන් කඩ කාමර 04 ක් විය. |

| | |
|---|---|
| (ii) 19 ඡේදය | බදුකරු හා සභාව විසින් නව ගිවිසුම් වලට එළඹිය යුතු වුවත්, 2016 නොවැම්බර් 10 දින වන විටත්, කඩ කාමර 16 ක බදුකරුවන් සමග නව ගිවිසුම්වලට එළඹ නොතිබුණි. |
| (ආ) 1980 අංක 47 දරන ජාතික පරිසර පනතේ 23 (අ) වගන්තිය යටතේ නිකුත් කර ඇති අංක 1533/16 හා 2008 ජනවාරි 25 දිනැති පාරිසරික හා ස්වභාවික සම්පත් අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලද අතිවිශේෂ ගැසට් පත්‍රය | පරිසර බලපත්‍ර ලබාගත යුතු වෙළඳ ව්‍යාපාර 29 ක් සඳහා පරිසර බලපත්‍ර ලබා දීමට සභාව විසින් කටයුතු නොකිරීම හේතුවෙන් රු.127,600 ක ආදායමක් අහිමි වී තිබුණි. කල් ඉකුත් වූ බලපත්‍ර 03 ක් සම්බන්ධයෙන් පසුවිපරම් කර බලපත්‍ර නිකුත් කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.9,490,412 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,076,577 ක් වූයෙන්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,413,835 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.4,413,835 ක වර්ධනයට ආදායම් විෂයයන් 03ක වැඩිවීම හා ගමන් වියදම් වැය විෂයයේ අඩුවීම මූලික වශයෙන් හේතු වී තිබුණි.

### 2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

2016, 2015 හා 2014 වර්ෂවල කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම් පිළිවෙලින් 2.1:1, 2.5:1 හා 2.1:1 ආදී වශයෙන් විය.

### 2.4 ආදායම් පරිපාලනය

#### 2.4.1 වරිපනම්

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) 2016 ජනවාරි 01 දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු.2,279,168 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයට බිල් කිරීම් රු.5,419,810 ක් වී තිබුණි. මෙම ශේෂයන්ගෙන් සමාලෝචිත වර්ෂය

තුළදී අයකිරීමේ ප්‍රතිශතය පිළිවෙළින් සියයට 67 ක් හා සියයට 61 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට හිඟය රු.3,158,364 ක් වූ අතර, එම ශේෂය තුළ වසරකට වඩා වැඩි කාලයක් ඉක්ම වූ රු.736,014 ක ශේෂ ඇතුළත් වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දී රජයේ ආයතන 9 කින් අයවිය යුතු හිඟ වරිපනම් බදු ශේෂය රු.377,386 ක් විය. මෙම හිඟය මාස 3 සිට වර්ෂ 12 ක් අතර කාල සීමාවකට අදාල විය.

### 2.3.2 බලපත්‍ර ගාස්තු

-----------------

වෙළඳ බලපත්‍ර හා ව්‍යාපාර බදු අය කලයුතු ආයතන පිළිබඳව විධිමත්ව සමීක්ෂණක් සිදුකර ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.3.3 වෙනත් ආදායම්

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ත්‍රී රෝද රථ නැවතුම්පොළ ගාස්තු

---------------------------------------

2010 දෙසැම්බර් 12 දිනැති අතුරු ව්‍යවස්ථාව මගින් ත්‍රී රෝද නැවතුම්පල 27 ක් හඳුනාගෙන තිබුණු අතර, එම ස්ථානවල ත්‍රී රෝද රථ නැවැත්වීම සඳහා විධිමත් පරිදි අවසර පත්‍ර ලබා දී නොතිබීමෙන් ත්‍රී රෝද රථ හිමියන්ගෙන් මුදල් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) ජල ගාස්තු

------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ හිටි ජල ගාස්තු ශේෂය රු.2,470,146 ක් වූ අතර, එම ශේෂයට වසරකට වඩා වැඩි කාලයක් ඉක්මවූ රු.352,861 ක ශේෂයක් ඇතුළත් වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 කාර්යසාධනය

----------------

සභා අරමුදලින් ක්‍රියාත්මක කිරීම සඳහා යෝජිත ව්‍යාපෘති 26 කින් ව්‍යාපෘති 04 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි. කර්මාන්ත ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය 2016 දෙසැම්බර් 20 දින ප්‍රමාද වී ලැබී තිබුණු බැවින් ව්‍යාපෘති 22 ක් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාව සතු පරණ පුස්තකාල ගොඩනැගිල්ලේ ඉහළ මහල ජාතික වෘත්තීය පුහුණු අධිකාරිය විසින් පුහුණු මධ්‍යස්ථානයක් ලෙස වර්ෂ ගණනාවක සිට පවත්වාගෙන යමින් තිබුණු අතර, එම ආයතනයෙන් කිසිදු අයවීමක් නොතිබූ අතර, ගිවිසුමකටද ඇතුළත් වී නොතිබුණි.

(ආ) අංක 12 එළුමස් කඩය හා අංක 15 ගවමස් කඩය බදුදීමට ප්‍රසම්පාදන දැන්වීම පලකර තිබුණද එම කඩ කාමර 02 ක සඳහා ටෙන්ඩර් කරුවන් දිගින් දිගටම ඉදිරිපත් වී නොතිබුණි. මෙම කඩ කාමර වෙනත් ව්‍යාපාර කටයුත්තක් සඳහා යොදවා සභාවේ ආදායම වර්ධනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සභාව සතු කඩ කාමරයක් ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කර බදු දීමට ක්‍රියාකර නොතිබුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාව සතු දේපල දීර්ඝකාලීන බදු පදනම මත බදු දීම සඳහා නගර සභා අඥා පනතේ 36 (ඉ) 11 වගන්තිය ප්‍රකාරව විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගත යුතු වුවත්, එසේ අනුමැතිය ලබා නොගෙන අංක 19, 20 , 21 හා 46 කඩ කාමර 4ක් 2000 වර්ෂයේ සිට 2017 මාර්තු 20 දින දක්වාම මාළු වෙළඳාම සඳහා දීර්ඝකාලීන බදු පදනම මත ලබා දී තිබුණි.

(ආ) සභාව විසින් 2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ගොඩනැගිලි සංවර්ධන බලපත්‍ර 256 ක් නිකුත් කර ඇතත්, ඉන් 69ක් සඳහා පමණක් අනුකූලතා සහතික නිකුත් කර තිබුණි.

3.4 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාව සතු යතුරු පැදියක්, අත්ට්‍රැක්ටර් රථ දෙකක්, බැකෝ යන්ත්‍රයක් හා පියෙට් වර්ගයේ කාර් රථය නිෂ්කාර්යව කාර්යාල භූමියේ දමා තිබුණු අතර, රු.333,700ක් වටිනාකම වූ ලී වඩු මැෂිම ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

(ආ) පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මඟින් ලබා දී තිබුණු ඩ්‍රම් ට්‍රක් රථය හා බැකෝ යන්ත්‍රය රියදුරන්ගේ ඌනතාවය මත නිෂ්ක්‍රීයව සභා භූමියේ දමා තිබුණි. නිෂ්ක්‍රීයව පවතින මෙම වාහන සඳහා දරා තිබුණු නඩත්තු වියදම රු.248,471ක් විය.

(ඇ) 2014 පෙබරවාරි 25 දින පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලැබී තිබූ රු.369,873 ක් වටිනා පරිගණක උපාංග හා කාර්යාල උපකරණ 2016 නොවැම්බර් 10 දින වන විටත්, කිසිදු ප්‍රයෝජනයක් නොගෙන නිෂ්ක්‍රීයව තබා තිබුණි.

(ඈ) සභා බල ප්‍රදේශයේ දරු දැරියන්ට සුභ සාධන සේවයක් සැලසීම සඳහා දිගු කාලයක සිට සභාවේ පවත්වාගෙන ගොස් තිබුණු කලා සංසදය 2014 වර්ෂයේ සිට අක්‍රිය වීම හේතුවෙන්, රු.193,500 ක් පමණ වටිනා සංගීත භාණ්ඩ නිෂ්ක්‍රීයව පැවතුණි.

3.5 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

-----------------------------------

සභා බල ප්‍රදේශයේ දිනකට කසල මෙට්‍රික් ටොන් 2 ½ ක පමණ ප්‍රමාණයක් එකතුවන අතර, දිරන කසල කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව වෙත ලබාදී තිබුණි. කසළ වෙන් කිරීම පිළිබඳ ජනතාව දැනුවත් කිරීම් සිදු කර තිබුණද, කසල වෙන් කර ලබා නොදීම හේතුවෙන් කසළ නිති පතා වෙන්කිරීමට සිදු වීම නිසා විශාල පිරිවැයක් දැරීමට සිදු වී තිබුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

----------------------------------------

4.1 අයවැය පාලනය

-------------------

සමාලෝචිත වර්ෂය තුළදී ආදායම් හා වියදම් විෂයයන් අතර, ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුවද අයවැයගත හා තත්‍ය ආදායම් හා වියදම් අතර, සැළකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

5. පද්ධති හා පාලනය

------------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකරනු ලැබේ.

(අ) ස්ථාවර වත්කම්

(ආ) ගිණුම්කරණය

(ඇ) වාහන පාලනය

(ඈ) ආදායම් පාලනය

(ඉ) ණයගැතියෝ සහ ණයහිමියෝ